# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 770 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 07/05/2024<br>පැය 0540 |

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - සිදම්බරපුරම් පොලිස් වසම.**

2024.05.06 වන දින සවස් කාලයේදී සිදම්බරපුරම් පොලිස් වසමේ මුරුගනූර් ප්‍රදේශයේදී පුද්ගලයෙකුට උදැල්ලකින් පහරදීම හේතුවෙන් මියගොස් ඇති බවට සිදම්බරම්පුරම් පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ කල්නාට්කුලම්, සිදම්බරම්පුරම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු බිරිඳගෙන් වෙන් වී තනිවම ජීවත් වන අතර මරණකරු හා බෑණනුවන් අතර ඇති වූ ආරවුලක් දුරදිග යාමෙන් ප්‍රකෝප වූ බෑනා විසින් මරණකරුට උදැල්ලකින් හා ඔහුගේ මිතුරෙකු ආරක්ෂක හිස්වැසුමකින්ද පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා රෝහල් ගත කිරීමකින් පසු මියගොස් ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය වව්නියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සිද්ධියට සම්බන්ධ අවුරුදු 22 හා 24 යන වයස් වල පසු වන සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇත. සිදම්බරම්පුරම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. නිවසක් බිඳ දේපල කොල්ල කා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම - වැලිගම පොලිස් වසම.**

2024.05.06 වන දින රාත්‍රී කාලයේදී වැලිගම පොලිස් වසමේ කුෂ්ඨරාජගල ප්‍රදේශයේ නිවසක් බිඳ දේපල කොල්ල කා එම නිවසේ සිටි කාන්තාවක් ඝාතනය කර ඇති බවට 119 මධ්‍යස්ථානයෙන් වැලිගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 78 ක් වූ කුෂ්ඨරාජගල, වැලිගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය, තම සහෝදරිය හා ඇයගේ ස්වාමිපුරුෂයා සමඟ ඉහත නිවසේ පදිංචිව සිට ඇති බවත්, සහෝදරිය සහ අයගේ ස්වාමි පුරුෂයා වැලිගම නගරයට පිටව ගොස් නැවත නිවසට පැමිණ බැලිමේදී ඇය ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් නිවස පරීක්ෂා කරන්නට විය. නිවසේ කාමරයක මරණකාරිය රෙදි වලින් ගැට ගසා බිම වැටී සිට ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. පසුව මරණකාරිය වැලිගම වලාන රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

මෘත ශරීරය වැලිගම වලාන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට තැත් කළ සැකකරුවෙකුගේ ප්‍රකාශ මත ගිනි අවියක් හා එම උණ්ඩ සොයා ගැනීමක් - කළුතර අපරාධ කොට්ඨාසය .

2024.05.05 වන දින හොරණ පොලිස් වසමේ ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමක් සම්බන්ධ විමර්ශනයේදී හඳුනාගත් සැකකරු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙන් විදේශ ගතවීමට යාමේදී ගුවන් තොටුපොල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන හොරණ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

කළුතර අපරාධ කොට්ඨසයේ නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශනය සඳහා පැය 48 ක කාලයක් රඳවා තබා ගනිමින් සිදුකරන ලද විමර්ශනයේදී 2024.05.06 වන දින රාත්‍රී කාලයේ ස්වයංක්‍රීය ටී56 ගිනි අවියක් හා එම උණ්ඩ 30 ක් මැගසින් 01 ක් පොලිස් භාරයට ගෙන හොරණ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.05.06 වන දින සවස් කාලයේ අඟුලාන පොලිස් වසමේ සයුරපුර ප්‍රදේශයේදී හා ගල්කිස්ස පොලිස් වසමේ වටරප්පල හන්දිය අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීම් 02 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 150 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 250 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අඟුලාන හා ගල්කිස්ස පොලිස් ස්ථානයන්ට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන කඩුඩාන, දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරිය වයස අවුරුදු 25 ක් වන සයුරපුර, අඟුලාන ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අඟුලාන හා ගල්කිස්ස පොලිස් ස්ථාන වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - අනුරාධපුර පොලිස් ස්ථානය.

2024.05.06 වන දින දහවල් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ මකුලෑව ප්‍රදේශයේදී අනුරාධපුර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත

වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 26 මිලිග්‍රෑම් 230 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 36 ක් වන මකුලෑව, හුරීගස්වැව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

2024.05.03 වන දින මත්ද්‍රව්‍ය වලට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහු රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වූ කරුණු මත මෙම සැකකාරිය අත්අඩංගුවට ගෙන ඇත.

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට - බගවන්තලාව පොලිස් ස්ථානය.

2024.05.06 වන දින රාත්‍රී කාලයේ බගවන්තලාව පොලිස් වසමේ කොටියාගල වත්තේදී බගවන්තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ පුද්ගලයින් දෙදෙනෙකු මැණික් ගැරීමට උපයෝගී කර ගත් උපකරණ සමඟ අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 45 හා 51 යන වයස් වල පසුවන කොටියාගල වත්ත, බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

බගවන්තලාව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කන්දකැටිය පොලිස් ස්ථානය.

2024.05.06 වන දින දහවල් කාලයේ කන්දකැටිය පොලිස් වසමේ මාලියද්ද ප්‍රදේශයේදී කන්දකැටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන වේලුමණ්කඩ, මාලියද්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කන්දකැටිය පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොලොන්න පොලිස් ස්ථානය.

2024.05.06 වන දින දහවල් කාලයේ කොලොන්න පොලිස් වසමේ අඹගහයාය ප්‍රදේශයේදී කොලොන්න පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 63 ක් වන කැල්ල, කොලොන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොලොන්න පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හසලක පොලිස් ස්ථානය.

2024.05.06 වන දින උදෑසන කාලයේ හසලක පොලිස් වසමේ බටුමුල්ල ප්‍රදේශයේදී හසලක පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 67 ක් වන උඩත්තව, බටුමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හසලක පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - නිට්ටඹුව පොලිස් වසම.

2024.05.06 වන දින අළුයම් කාලයේදී නිට්ටඹුව පොලිස් වසමේ කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ නිට්ටඹුව නගරයේදී කොළඹ දෙස සිට නුවර දෙසට ධාවනය වූ වෑන් රථයක් පදික මාරුවේදී මාර්ගය හරහා ගමන් ගත් පදික කාන්තාවක්ගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික කාන්තාව බරපතල තුවාල ලබා වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 70 ක් වූ වැලිකඩමුල්ල, අත්තනගල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - වලපනේ පොලිස් වසම.

2024.05.06 වන දින දහවල් කාලයේදී වලපනේ පොලිස් වසමේ නිල්දණ්ඩාහින්න කලගන්වත්ත පටු වංගු සහ බෑවුම් සහිත මාර්ගයේ මාලිගාතැන්න ගල්පොත්ත ප්‍රදේශයේදී කලගන්වත්ත දෙස සිට නිල්දණ්ඩාහින්න දෙසට ධාවනය වූ බැකෝ යන්ත්‍රයක් රියදුරුට පාලනය කරගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මීටර් 09 ක් පමණ ප්‍රපාතයකට පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් රියදුරු බරපතල තුවාල ලබා නිල්දණ්ඩාහින්න රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ කුට්ටාපිටිය, පැල්මඩුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය නිලදණ්ඩාහින්න රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වලපනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - කිලිනොච්චිය පොලිස් වසම.

2024.05.06 වන දින රාත්‍රී කාලයේදී කිලිනොච්චිය පොලිස් වසමේ මහනුවර යාපනය ඒ9 මාර්ගයේ පරන්තන් ප්‍රදේශයේදී කිලිනොච්චිය දෙස සිට යාපනය දෙසට ධාවනය වූ බස් රථයක් යාපනය දෙස සිට කිලිනොච්චිය දෙසට මාර්ගයේ වම් පසින් පයින් ගමන් කළ පදික පුද්ගලයෙකුගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත.

අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා කිලිනොච්චිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ නෙලුම්කුලම්, වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය කිලිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - මත්තේගොඩ පොලිස් වසම.

2024.05.06 වන දින රාත්‍රී කාලයේදී මත්තේගොඩ පොලිස් වසමේ කිරිගම්පමුණුව සල්ගස් හන්දිය ප්‍රධාන මාර්ගයේ මත්තේගොඩ නගරය ප්‍රදේශයේදී කිරිපමුණුගම දෙස සිට සල්ගස් හන්දිය දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගයේ ගමන් කරමින් සිටි පදික කාන්තාවකගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව හෝමාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 69 ක් වූ බණ්ඩාරනායකපුර, මත්තේගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මත්තේගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**